# බයිබල් දැනුම මිනුම තරගය 2026 - 2033

## ගිවිසුම්දායකයාණන් වන දෙවියන් වහන්සේ



ගිවිසුම්දායකයාණන් හා සභානායකයාණන් වන දෙවියන් වහන්සේ

## කාණ්ඩය : 8 හා 9 ශ්‍රේණි

සැකසුම: ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය
සංවිධානය සහ මූල්‍ය අනුග්‍රහය: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

# බයිබල් දැනුම මිනුම තරඟය

## 8 ශ්‍රේණිය - තේමාව

## ගිවිසුම්දායකයාණන් වන දෙවියන් වහන්සේ

| මාතෘකාව | ප්‍රධාන බයිබල් පරිච්ඡේද | ඉගෙනුම් ඵල | අමතර බයිබල් පාඨ | අරමුණ |
|---|---|---|---|---|
| ඒදන් උයනේ ගිවිසුම | උත්පත්ති 3:9 - 15, 21 | දරුවන් මිනිසාගේ වැටීමෙන් පසු දෙවියන් වහන්සේ දුන් ගැලවීමේ පළමු පොරොන්දුව ඉගෙන ගනියි. | උත්පත්ති 3:15<br>ගීතාවලිය 25:10<br>හෙබ්‍රෙව් 8:10 | බලාපොරොත්තු සහගත ගිවිසුම් ඉතිහාසය දෙවියන් වහන්සේ ආරම්භ කරන බව පෙන්වා දීම. |
| ආබ්‍රහම්තුමා සමඟ කළ ගිවිසුම | උත්පත්ති 12:1-3,7 | ▪ ආසිරි පැතීමේ නාමයක්<br>▪ දේශයක්<br>▪ පෙළපතක්<br>දෙවියන් වහන්සේගේ පොරොන්දු බව දැනගනියි. | උත්පත්ති 15:6<br>ගලාති 3:29<br>හෙබ්‍රෙව් 6:13-14 | දෙවියන් වහන්සේගේ ගිවිසුම විශ්වාසය හරහා ඇදහිල්ල ගොඩ නගන බව පෙන්වයි. |
| නෝවා සමඟ ගිවිසුම | උත්පත්ති 9:8-17 | දෙවියන් වහන්සේ ජලගැල්මෙන් පසු මැවිල්ල ආරක්ෂා කිරීමට දුන් පොරොන්දු අලුත් කරයි. | උත්පත්ති 9:11<br>යෙසායා 54:9<br>ගීතාවලිය 145:13 | දෙවියන් වහන්සේගේ කරුණාව හා ආරක්ෂාව ගිවිසුම් මඟින් පෙන්වන බව. |
| ජේසුස් වහන්සේ හා මරියතුමිය | ලූක් 2:22 - 40<br>ලූක් 2:41 - 47<br>ජොහාන් 19:26 - 28, 2:1 - 11 | ගිවිසුම් පූර්ණත්වයේ කේන්ද්‍ර ස්ථානය මරියතුමිය හා ජේසුස් වහන්සේ බව දකියි. | ජොහාන් 1:14<br>ගලාති 4:4<br>මතෙව් 1:23 | දෙවියන් වහන්සේගේ ගිවිසුම ක්‍රිස්තුස් වහන්සේ තුළ සම්පූර්ණත්වයට පත් වූ බව පෙන්වීමට. |
| ආශීර්වාදකාර බන්ධනය | මතෙව් 19:6 | විවාහය, ගිවිසුම් ආදරය හා විශ්වාසවන්ත බව තේරුම් ගනියි. | එපීස 5:25<br>1 කොරි 13:8<br>මලාකි 2:14 | දෙවියන් වහන්සේගේ විශ්වාසවන්ත ගිවිසුම් ආදරය ගැන මෙනෙහි කිරීමක් බව. |
| විශ්වාස ලක්ෂණය | අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය 2 හා 3 වගන්ති | දරුවන් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි හා උන්වහන්සේගේ මිනිස් බව ගැනීම ගැන ගැඹුරින් විශ්වාස කරයි. | ජොහාන් 3:16<br>ජොහාන් 1:14<br>කොලොස්සි 1:15-16 | ජේසුස් වහන්සේගේ ජීවිතය හා මෙහෙවර තුළ දෙවියන් වහන්සේගේ ගිවිසුම් සම්පූර්ණ වූ බව. |
| යාච්ඤාවේ ගිවිසුම | සෙකරියස්ගේ ප්‍රශංසා ගීතය<br>ලූක් 1:68-79 | දරුවන් දෙවියන් වහන්සේගේ ගිවිසුම් පොරොන්දු සඳහා ප්‍රශංසා කරයි. | ලූක් 1:68<br>ගීතාවලිය 34:1<br>විලාප ගී 3:22 | දෙවියන් වහන්සේගේ කරුණාවට හා විශ්වාසනීයත්වයට කෘතඥතාවය දක්වයි. |

# බයිබල් දැනුම මිනුම තරඟය

## 9 ශ්‍රේණිය - තේමාව : ගිවිසුම්දායකයාණන් ලෙස දෙවියන් වහන්සේ

| මාතෘකාව | ප්‍රධාන බයිබල් පරිච්ඡේද | ඉගෙනුම් ඵල | අමතර බයිබල් පාඨ | අරමුණ |
|---|---|---|---|---|
| මොසෙස්තුමා සමඟ ගිවිසුම | නික්මයාම 19:3-6 | දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව සමඟ ගිවිසුමක් ඇති කර ඔවුන්ව ශුද්ධභාවයට කැඳවූ බව තේරුම් ගනියි. | ''නුඹලා මට පූජක ජාතියක් ද කැපවූ ජාතියක් ද වන්නහුය.'' නික්මයාම 19:6 | දෙවියන් වහන්සේගේ සැලැස්ම වනුයේ උන්වහන්සේගේ ජනතාව ශුද්ධව හා වෙන් කර තබා ගැනීම බව පෙන්වයි. |
| නව ගිවිසුම තුළ දිවැස් වැකි | ජෙරමියා 31:31-34 | ක්‍රිස්තුස් වහන්සේගේ පැමිනීමට සූදානම ගැන දෙවියන් වහන්සේගේ නීතිය මිනිස් හදවත් මත කොටා ඇති බව දැන ගනියි. | ''මම මාගේ අණ පනත් ඔවුන් තුළ පිහිටුවා එය ඔවුන්ගේ සිත්වල ලියන්නෙමි.'' ජෙරමියා 31:33 | දෙවියන් වහන්සේ ඇතුලාන්තික පරිවර්තනයක් සමඟ සමීප සම්බන්ධතාවයක් අපේක්ෂා කරයි. |
| කල්වාරි ගිවිසුම | 1 කොරින්ති 11:23-26<br>ලූක් 22:20 | දිව්‍ය සත්ප්‍රසාදය අළුත් ගිවිසුම බවත් ජේසුස් වහන්සේගේ ජීවිත පූජාවට සම්බන්ධ වන බවත් හදුනා ගනියි. | ''එලෙසම භෝජනයෙන් පසු කුසලාන දී මේ කුසලානය ඔබ උදෙසා වගුරවනු ලබන මාගේ රුධිරයෙන් කළ නව ගිවිසුමය.''<br>ලූක් 22:20 | සෑම දිව්‍ය පූජාකවදීම ජේසුස් වහන්සේගේ මරණය හා ගැළවීමේ සහභාගීත්වය ප්‍රකාශ කරයි. |
| ගිවිසුම් කරඬුව වන මරියෝත්තමාවෝ | එළිදරව්ව 11:19<br>ලූක් 1:35 | කීකරුකමේ හා බැහැපත්කමේ පරමාදර්ශය ලෙස මරියතුමියව දකියි. | ''ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහළ වන සේක. පරමෝත්තමයාණන්ගේ ආනුභාවයද ඔබ වසාග න්නේය.''<br>ලූක් 1:35 | සැබෑ කරඬුව වන ජේසුස් වහන්සේව රුගෙන ගිය බවත් මරියතුමිය ජේසුස් වහන්සේගේ කය දරාගත් බවත් දෙවියන් වහන්සේගේ සැලැස්මට විශ්වාසවන්තව සහයෝගය දක්වූ බව උගන්වයි. |

| | | | | |
|---|---|---|---|---|
| අපෝස්තුළුවරුන්ගේ කැඳවීම | මතෙව් 10:1-4<br>ලූක් 6:12-16 | දෙවියන් වහන්සේගේ කැඳවීම තුළ ස්ථිර වීමත් අපෝස්තලික දූත මෙහෙවරත් තේරුම් ගනියි. | "ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් 12දෙනා තමන් වෙත කැඳවා අශුද්ධාත්මයන් දුරු කරන පිනිස ද සියලු ආකාර ලෙඩ රෝග සුව කරන පිණිස ද ඔවුන්ට බලය පවරා දුන් සේක."<br>මතෙව් 10:1 | අපෝස්තුළුවරු ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දරමින් උන්වහන්සේගේ මෙහෙවර සභාව තුළ ඉදිරියටම කරගෙන යයි. |
| පූජකවරය ගිවිසුමක් ලෙස | ගීතාවලිය 110:4<br>හෙබ්‍රව් 5:1-10 | පූජකවරුන්ගේ හා රදගුරුවරුන්ගේ කාර්‍යභාරය ජීවිත කාලීන ගිවිසුමක් ලෙස දැන ගනියි. | "නුඹ මෙල්කිසදෙක් පරපුරෙන් සදහටම පූජකයෙක් යැයි සමිදාණෝ දිවුල සේක."<br>ගීතාවලිය 110:4 | අධිකාරීත්වය, සේවාවේ අධ්‍යාත්මිකත්වය, වගකීම හා ගිවිසුම් ස්වභාවය ඉස්මතු කරන බව. |
| විශ්වාස ලක්ෂණය | අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණය 4,5,9 වගන්ති | ගිවිසුම් පොරොන්දු හා සභා මෙහෙවර සම්බන්ධ කරමින් එම වගන්ති උච්චාරණය කර පැහැදිලි කරයි. | "ධර්මයාණෝ මාංශගතව අප සමග වැඩ විසූ සේක."<br>ජොහාන් 1:14<br><br>ධර්මදූත සේවාව පැවරීම.<br>මතෙව් 28:19 | ක්‍රිස්තුස් වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේ හා ශු. සභාව තුළ තිබෙන්නා වූ විශ්වාසය ශක්තිමත් කරමින් ඇදහිල්ල හා ක්‍රියාව සම්බන්ධ කරයි. |
| යාච්ඤාව මරියාවන්ගේ උදාන ගීය | ලූක් 1:46-56 | දෙවියන් වහන්සේගේ දයා කරුණාව හඳුනා ගනිමින් ගිවිසුම් ප්‍රීතියේ හා තුති පිදීමේ ගීතයක් ලෙස යාච්ඤා කරයි. | "මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි."<br>ලූක් 1:46<br><br>"මහ නරපතීන් සිය සිහසුන් වලින් පහත හෙලා දීනයන් ඉහළ නංවා උසස් කළ සේක."<br>ලූක් 1:52 | කෘතඥතාවයත් විශ්වාසයත් කීකරුකමත් දිරිමත් කරයි. |